# ජාතික පුනර්ජීවනයෙහි ලා ධර්මපාල භූමිකාව

**බිහේෂ් ඉන්දික සම්පත්**[1]

[1]*සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

[*]*bihesh@gmail.com*

අනගාරික ධර්මපාලතුමා (1864. 09. 17 - 1933. 04. 29) විසින් ජාතික පුනර්ජීවනය උදෙසා ගන්නා ලද විශේෂ ක්‍රියාමාර්ග පිළිබඳ විවරණයක් සිදු කිරීම මෙම පත්‍රිකාවේ අරමුණ යි. ධර්මපාලතුමන් ගේ ජාතික පුනර්ජීවන ක්‍රියාවලියෙහි විශේෂතා හඳුනා ගැනීම සහ ඒවා වර්තමානයේ ද උපයුක්ත කොට ගැනීමෙහි ලා සමාජය පෙලඹවීම ද මෙහි අපේක්ෂාවකි. මෙය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් මුද්‍රිත පොත-පත හා අන්තර්ජාලගත තොරතුරු ඇසුරු කොට ගනිමින් සිදු කෙරෙන අධ්‍යයනයකි. ධර්මපාලතුමා දියත් කළ ජාතික පුනර්ජීවන ව්‍යාපාරය අදියර කිහිපයකින් යුක්ත වේ. ඒ සඳහා ඔහු බුදුදහමේ එන චතුරාර්ය සත්‍යයට සමාන වූ ක්‍රමවේදයක් අනුගමනය කළ බව පෙනේ. පළමු කොට අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ, රට තුළ ඇති දූෂිත තත්ත්වය, බුදුදහමින් දුරස්වීමේ බේදවාචකය වැනි ගැටලු ඔහු හඳුනා ගත්තේ ය. එය දුඃඛ සත්‍යය වටහා ගැනීම හා සමාන ය. දුකට හේතුව වශයෙන් ඔහු හඳුනා ගත්තේ නිවැරදි බෞද්ධ නායකත්වයක් හා බෞද්ධ අධ්‍යාපනයක් නොමැති වීම යි. ඒ අනුව එම ගැටලුව විසඳීමට (දුක නැති කිරීමට) තමන් ගේ නායකත්වය යටතේ සිව්වනක් පිරිස ම ප්‍රතිසංවිධානය කළේ ය. ජනවාර්ගික ගැටලුව හමුවේ සිංහලයන් ගේ භූමිකාව විය යුත්තේ කුමක් ද යන්න මුල් වරට පුළුල් කතිකාවකට බඳුන් කළ නූතන යුගයේ චින්තකයා ධර්මපාලතුමා ය. ජාතික ගැටලු විසඳීමෙහි මාර්ගය වශයෙන් බෞද්ධ හරයන් මත බිහි වූ දෘෂ්ටිවාදයකින් ඊට අර්ථකථන සපයා දීම විශේෂත්වයකි. ආධ්‍යාත්මික සංවර්ධනය තුළින් පමණක් ජාතියක් ප්‍රගමණයට පත් කළ නොහැකි බව වටහා ගත් එතුමා ලංකාවේ දේශීය ව්‍යාපාර හා ස්වජාතික කර්මාන්ත සංවර්ධනය උදෙසා ඇප-කැප වී ය. ප්‍රාචීන මෙන් ම ප්‍රතිචීන භාෂා සාහිත්‍යයන් පිළිබඳ ඥානය පතුරුවා හැරීම හා ජාත්‍යන්තර සම්බන්ධතා ඇතිකර ගැනීමත් අධිරාජ්‍යවාදී නීතිරීති අභියෝගයට ලක් කිරීමත් තුළින් දූපත් මානසිකත්වය හා බියගුලු භාවය මෙරට වැසියන් වෙතින් ප්‍රහීණ කරවීමට කටයුතු කිරීම ජාතික පුනර්ජීවනයේ දී ඔහුගෙන් සැලසුණු සේවාවකි. බෞද්ධ ජාතිමාමක බලවේග වශයෙන් මහාබෝධි සංගමය, තරුණ බෞද්ධ සංගමය වැනි සංවිධාන පිහිටුවා ගැනීම වෙනුවෙන් කටයුතු කළ ද එතුමා ජාතිවාදී - ආගම්වාදී දෘෂ්ටියකින් ප්‍රස්තුතය අර්ථ දැක්වූයේ නැත. එතුමා, අන් ජාතීන්ට ඉච්ඡාභංගත්වයක් ඇති නොවන පරිදි තම ජාතික පුනර්ජීවන ක්‍රියාමාර්ග පවත්වා ගෙන ගියේ ය. ඔහු පුනර්ජීවයක් ඇති කළේ සමස්ත ලාංකේය ජාතියේ ම ය.

මුඛ්‍ය පද ඃ ජාතිය, පුනර්ජීවනය, ධර්මපාල, චතුරාර්ය සත්‍යය, බෞද්ධ